දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112694033, 0112675280
Telephone ) 0112675449

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax )0112692913

විද්‍යුත් තැපැල ) postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

මගේ අංකය ) MH/AD/01/09/DDG(LS)/2025
எனது இல )
My No. )

02

ඔබේ අංකය )
உமது இல )
Your No. )

දිනය ) 2025. 07. 15
திகதி )
Date )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

# සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
# சுகாதார மற்றும் வெகுஜன ஊடக அமைச்சு
# Ministry of Health & Mass Media

පොදු චක්‍රලේඛ ලිපි අංක : 02 – 55/2025

පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්,
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන් - ජාතික රෝහල (කොළඹ, මහනුවර, ගාල්ල)
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
ශික්ෂණ රෝහල් අධ්‍යක්ෂවරුන්, විශේෂිත ව්‍යාපාර අධ්‍යක්ෂවරුන්,
රේඛීය අමාත්‍යාංශය යටතේ ඇති සියලුම රෝහල් හා ආයතන ප්‍රධානීන්.

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (රසායනාගාර සේවා) තනතුර
## සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

අංක 1883/17 දරන 2014.10.11 දිනැති ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවයේ වෛද්‍ය සේවා ව්‍යවස්ථාවේ සහ ඉන් පසු එයට වරින් වර කරන ලද සංශෝධනයන්හි පරිශිෂ්ඨය V හි සඳහන් ඉහත තනතුරට අදාළ සුදුසුකම් ලද **ශ්‍රී ලංකා වෛද්‍ය සේවයේ ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ වෛද්‍ය නිලධරයන්ගෙන් සහ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධරයන්ගෙන්** අයදුම්පත් කැඳවනු ලැබේ.

02. අදාළ අයදුම්පත් මේ සමඟ ඇති ආදර්ශ ආකෘතියට අනුව සකස් කොට, ලේකම්, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය, "සුවසිරිපාය", 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10 යන ලිපිනයට 2025.07. 28 දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ **ලියාපදිංචි තැපෑලෙන් පමණක්** එවිය යුතුය.

03. තම අයදුම්පත්‍රය ඉල්ලා අස් කර ගැනීමට කිසිවෙකු අදහස් කරන්නේ නම් ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දින සිට සති දෙකක් ඇතුළත මා වෙත දන්වා එසේ කිරීමට ඔහුට/ඇයට හැකිය.

04. රැකියා විස්තරය

I. අධ්‍යක්ෂ (රසායනාගාර සේවා) සහ අධ්‍යක්ෂ (රුධිර පාරවිලයන සේවාව) යන තනතුරුවල රාජකාරි කටයුතු සහ කාර්ය සාධනය අධීක්ෂණය කිරීම සහ මෙහෙයවීම, වෛද්‍ය පර්යේෂණ ආයතනයේ රසායනාගාර සේවා සහ සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති අදාළ අනෙකුත් ආයතනවල රසායනාගාර සේවා අධීක්ෂණය

II. ඉහත අධ්‍යක්ෂවරුන්ට අදාළ සියලු ක්‍රියාකාරකම් නිසි පරිදි සැලසුම් කරන බවට සහතික කිරීම

III. සෞඛ්‍ය රසායනාගාර ප්‍රතිපත්තිය, ජාතික රුධිර ප්‍රතිපත්තිය, ජෛව සුරක්ෂිතතාව සහ ජෛව ආරක්ෂණය පිළිබඳ ප්‍රතිපත්තිය යන සියලුම ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ සැලසුම් ස්ථාපිත කිරීම

IV. සුරක්ෂිත රුධිරය සහ රුධිර නිෂ්පාදන පවතින බවට සහතික කිරීම සඳහා සියලු පියවර ගැනීම

V. සියලුම හඳුනාගත් ප්‍රතිකාර මධ්‍යස්ථානවල සහ ජාතික රුධිර පාරවිලයන සේවාවන්වල ප්‍රමාණවත් ලෙස නිෂ්පාදන පවත්වා ගැනීම

VI. දිවයින පුරා ගුණාත්මක රසායනාගාර සේවා ව්‍යාප්ත කිරීම මගින් රෝග විනිශ්චය, රෝග සහ සෞඛ්‍ය තත්ත්වයන්ට ප්‍රතිකාර කිරීම මෙන්ම රෝග නිවාරණය සඳහා ද රජයට දැරිය හැකි මුදලකට පිළිගත් රසායනාගාර තාක්ෂණයන් භාවිතා කරනු ලබන බවට සහතික වීම

VII. රසායනාගාර සේවාවන්ට අදාළව මානව, මූල්‍ය සහ භෞතික සම්පත් නිසි පරිදි බෙදා හැරීම පිළිබඳ සහතික වීම

VIII. ඉහත වෛද්‍ය ක්ෂේත්‍රයන්හි තිරසාර සංවර්ධනය සහතික කරනු වස් අදාළ සියලුම ජාතික හා අන්තර්ජාතික නියෝජිත ආයතන සමඟ සබඳතා වර්ධනය කිරීම සහ පවත්වා ගෙන යාම

IX. සෞඛ්‍ය හා ජනමාධ්‍ය ලේකම් විසින් ලබා දෙන උපදෙස් පරිදි, පළාත් සෞඛ්‍ය සත්කාර ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම

X. ප්‍රති වක ප්‍රතිරෝදය පාලනය සඳහා වන ක්‍රියාකාරකම් සඳහා කේන්ද්‍රීය නිලධාරියා වශයෙන් ජාතික වශයෙන් කටයුතු කිරීම

XI. සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ජීව විද්‍යාත්මක අවි පිළිබඳ සම්මුතිය සඳහා කේන්ද්‍රීය නිලධාරියා ලෙස කටයුතු කිරීම

XII. සෞඛ්‍ය හා ජනමාධ්‍ය ලේකම් විසින් හෝ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් පවරනු ලබන අදාළ වෙනත් ඕනෑම රාජකාරී ඉටු කිරීම

## 05. සේවා නියමයන් හා කොන්දේසි

(අ) මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. තෝරාගනු ලබන අපේක්ෂකයා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ VIII වැනි පරිච්ඡේදයේ 118 වගන්තිය අනුව අවුරුදු 01 ක වැඩ බැලීමේ පදනම මත පත් කරනු ලැබේ. වැඩ බැලීමේ කාලය තුළ කිසියම් අවස්ථාවකදී නැතහොත් වැඩබැලීමේ කාලය අවසානයේදී තෝරාගත් නිලධාරියා කිසියම් හේතුවක් නිසා එම තනතුර දැරීමට නුසුදුසු බව හෙළිදරව් වන්නේ නම්, එම නිලධරයා ඔහුගේ පූර්ව තනතුරට පෙරළා යවනු ලැබේ.

(ආ) මෙම තනතුරට පත් කරනු ලබන නිලධාරියාහට පෞද්ගලික වෛද්‍ය සේවයේ යෙදීමට හිමිකමක් නොමැත.

(ඇ) අංක 2410/09 හා 2024.11.17 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා වෛද්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 07 වන සංශෝධනයේ 11.1.2.3 හි VIII වගන්තිය ප්‍රකාරව මෙම තනතුර අවසන් සේවා ස්ථානීය තනතුරක් ලෙස සලකනු ලබන අතර ස්ථාන මාරුවීම්වලට යටත් නොවේ.

(ඈ) සියලු පත්කිරීම් ඉදිරි දිනක සිට ක්‍රියාත්මක වනු ඇති අතර, දැනටමත් මෙම තනතුරේ වැඩ බලන හෝ රාජකාරි ඉටු කරන හෝ රාජකාරි ආවරණය කරන නිලධාරියෙකු තෝරා ගත හොත් එම නිලධාරියාහට තම පත්කිරීම පෙරදාතම් කිරීම සඳහා ඉල්ලීමට කිසිඳු හිමිකමක් නොමැත.

## 06. වැටුප් ක්‍රමය

(අ) මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 අනුව SL-03-2025 වැටුප් බණ්ඩයේ පියවර 1 (රු. 156,000 - 12 X 4850 – 214,200) අදාළ වේ.

(ආ) පශ්චාත් උපාධි සුදුසුකම් සහිත වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ නිලධාරීන්ට මසකට රු. 6,000/- ක් බැගින් වූ වෛද්‍ය පරිපාලන දීමනාවක් ගෙවනු ලැබේ.

(ඇ) මෙම තනතුරට විශේෂඥ වෛද්‍ය නිලධරයකු තෝරාගනු ලැබුවහොත් විශේෂඥ වෛද්‍ය ශ්‍රේණියට හිමි වැටුප් දීමනා ලබා ගැනීමට ඔහුට/ ඇයට හිමිකම් ඇත.

## 07. වයස් සීමාව

සුදුසුකම් ලබන අයදුම්කරුවන් දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් වන බැවින් වයස සීමාව අදාළ නොවේ.

## 08. සුදුසුකම්

I. අංක 2410/09 හා 2024.11.17 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවයේ වෛද්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 07 වන සංශෝධනයෙහි 11.1.2.3 (අ) අනුව, වෛද්‍ය සේවා ව්‍යවස්ථාවේ පරිශිෂ්ඨ II හි ලැයිස්තුගත කරන ලද විද්‍යාපති (වෛද්‍ය පරිපාලන/ ප්‍රජා වෛද්‍ය) උපාධියක් ලබා ඇති ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරියෙකු හෝ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරියෙකු හෝ විශේෂඥ වෛද්‍ය නිලධාරියෙකු වීම.

(2007.04.16 දිනැති අංක 1493/3 දරන ගැසට් නිවේදනය ක්‍රියාත්මකවන දින වනවිට ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ තනතුරක් දරන නිලධාරියෙකුට මෙම අනිවාර්ය සුදුසුකම අදාළ නොවේ.)

II. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හා ඊට අනුෂාංගික චක්‍රලේඛයන්හි විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතු ය.

III. සියලු සුදුසුකම්, අයදුම්පත් භාර ගනු ලබන අවසාන දිනයට සලකා බලනු ඇත.

## 09. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දීමේ පරිපාටිය

| | නිර්ණායක | ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| I. | **සේවා කාලය**<br>(ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ සක්‍රිය සේවා කාලය සඳහා වසරකට ලකුණු 05 බැගින් උපරිම ලකුණු 50)<br>"සක්‍රීය සේවා කාලය ගණනය කිරීමේ දී වසරකට අඩු කාලයක් සඳහා කාර්තු වශයෙන් සමානුපාතිකව ලකුණු ගණනය කෙරේ" | මුළු ලකුණු 50 |
| II. | **පශ්චාත් උපාධි සුදුසුකම්**<br>ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවයේ වෛද්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 07 වන සංශෝධනයෙහි 11.1.2.3 හි (අ) II හි විධිවිධාන හා අන්තර්කාලීන විධිවිධානවලට අනුව පහත පරිදි ලකුණු හිමි වේ.<br>වෛද්‍ය විශාරද උපාධිය (වෛද්‍ය පරිපාලන/ ප්‍රජා වෛද්‍ය) - ලකුණු 15<br>විද්‍යාපති උපාධිය (වෛද්‍ය පරිපාලන/ ප්‍රජා වෛද්‍ය) - ලකුණු 10<br>"සැ.යු. - මේ අතුරින් ලබා ගෙන ඇති ඉහළ ම සුදුසුකමට පමණක් ලකුණු හිමි වේ" | මුළු ලකුණු 15 |

| | | | |
|---|---|---|---|
| III. | අමතර සුදුසුකම් | | |
| | 01. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ සිදු කරන ලද විශේෂ ව්‍යාපෘති<br><br>(එක් ව්‍යාපෘතියකට ලකුණු 02 බැගින් ව්‍යාපෘති 05 ක් සඳහා උපරිම ලකුණු 10)<br><br>(අ) ව්‍යාපෘති ඇගයීමේදී ඇමුණුම 1 හි සඳහන් නිර්ණායක පදනම් කර ගනු ලැබේ.<br><br>(ආ) අයදුම්පත්‍රය සමඟ ව්‍යාපෘති ලැයිස්තුව ඉදිරිපත් කළ යුතු අතර එම ලැයිස්තුවේ ඇතුළත් ව්‍යාපෘති පමණක් සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දීම සඳහා සලකා බලනු ලැබේ.<br><br>(ඇ) විශේෂ ව්‍යාපෘති සඳහා ලකුණු ලබා දීමේ දී ඇමුණුම 2 හි සඳහන් ලකුණු පරිපාටිය භාවිත කරනු ලැබේ.<br><br>"සැ.යු. - අයදුම්පත් භාර ගැනීමේ අවසන් දින හෝ ඊට පෙර සම්පූර්ණ කරන ලද ව්‍යාපෘති විය යුතුය" | ලකුණු 10 | මුළු ලකුණු 25 |
| | 02. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රය යටතේ පළ කරන ලද පර්යේෂණ/ ප්‍රකාශන<br><br>(එක් පර්යේෂණ/ප්‍රකාශනයකට ලකුණු 02 බැගින් පර්යේෂණ/ප්‍රකාශන 05 ක් සඳහා උපරිම ලකුණු 10)<br><br>(අ) පර්යේෂණ/ප්‍රකාශන ඇගයීමේදී ඇමුණුම 3 හි සඳහන් නිර්ණායක පදනම් කර ගනු ලැබේ.<br><br>(ආ) අයදුම්පත්‍රය සමඟ පර්යේෂණ/ප්‍රකාශන ලැයිස්තුව ඉදිරිපත් කළ යුතු අතර එම ලැයිස්තුවේ ඇතුළත් පර්යේෂණ/ප්‍රකාශන පමණක් සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දීම සඳහා සලකා බලනු ලැබේ.<br><br>(ඇ) පර්යේෂණ/ප්‍රකාශන සඳහා ලකුණු ලබා දීමේ දී ඇමුණුම 4 හි සඳහන් ලකුණු පරිපාටිය භාවිත කරනු ලැබේ.<br><br>"සැ.යු. - ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන ශ්‍රේණියට පත්වීම් ලද පසු සිදු කරනු ලැබූ පර්යේෂණ/ප්‍රකාශන විය යුතු අතර, අයදුම්පත් භාර ගැනීමේ අවසන් දින හෝ ඊට පෙර සම්පූර්ණ කරන ලද පර්යේෂණ/ප්‍රකාශන විය යුතුය" | ලකුණු 10 | |
| | 03. මණ්ඩල සහතිකය<br><br>(වෛද්‍ය පරිපාලන/ ප්‍රජා වෛද්‍ය) | ලකුණු 05 | |
| IV. | සම්මුඛ පරීක්ෂණය<br><br>(කුසලතා, නායකත්වය, ආකල්ප, පෞරුෂත්වය හා සන්නිවේදන කුසලතා සඳහා) | | මුළු ලකුණු 10 |
| | මුළු ලකුණු ප්‍රමාණය | | 100 |

10. අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය හෝ ඊට ප්‍රථම ඒවා ආයතන ප්‍රධානීන් හෝ විමධ්‍යගත ඒකක / විශේෂිත ව්‍යාපාර ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් භාර ගනු නොලැබේ.

11. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2014.10.11 දිනැති අංක 1883/17 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් පළ කරන ලද ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවයේ වෛද්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහයෙහි සහ එයට වරින් වර කරන ලද සංශෝධනයන්හි විධි විධාන, රාජ්‍ය සේවයේ තනතුරුවලට බඳවා ගැනීම සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභා පරිපාටික රීතීන්හි I වැනි කාණ්ඩයේ ඇතුළත් කොන්දේසි සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ ඇතුළත් කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

12. මෙම නිවේදනයේ සිංහල, ඉංග්‍රීසි හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වන්නේය.

13. මෙම තනතුරට පත් කිරීම සම්බන්ධයෙන් හෝ මෙම චක්‍රලේඛය මඟින් ආවරණය වන හෝ නොවන යම් කරුණක් සම්බන්ධයෙන් හෝ යම් ගැටළුසහගත තත්ත්වයක් උදා වුවහොත්, ඒ පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවේ තීරණය අවසන් තීරණය වනු ඇත.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවේ නියමය පරිදි,

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
ලේකම්
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
ලේකම්
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

ඇමුණුම 1

<u>විශේෂ ව්‍යාපෘති ඇගයීම සඳහා යොදා ගත යුතු නිර්ණායක</u>

I. ව්‍යාපෘතිය අයදුම්කරු විසින් අයදුම්කර ඇති තනතුරට අයත් රාජකාරී කටයුතු යටතට ගැනෙන විෂය ක්ෂේත්‍රයන්ට අදාළ ව්‍යාපෘතියක් විය යුතුය.

II. ව්‍යාපෘති වාර්තාව මඟින් ව්‍යාපෘතියේ අරමුණු, පූර්වාපේක්ෂිත ප්‍රතිඵල, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන ස්ථානය, මූල්‍ය වටිනාකම, ව්‍යාපෘතියේ කාල රාමුව සහ මූල්‍ය ප්‍රභවය පැහැදිලිව ඉදිරිපත් කර තිබිය යුතුය.

III. ආයතනික හෝ ප්‍රජා සෞඛ්‍ය සම්බන්ධ ගැටළු/ ප්‍රශ්න සඳහා ව්‍යාපෘතිය මඟින් නිර්මාණාත්මක සහ නවෝත්පාදක උපාය මාර්ග/ විසඳුම් හඳුන්වා දිය යුතු අතර ව්‍යාපෘතිය මඟින් නිලධරයාගේ සාමාන්‍ය රාජකාරී කටයුතුවලින් ඔබ්බට ගිය මැදිහත්වීමක් සිදුවී තිබිය යුතුය.

IV. ව්‍යාපෘතිය මඟින් අපේක්ෂිත ප්‍රතිඵල අත්පත් කර ගත් බවට අදාළ සුදුසු නිපුණතාවය සහිත ආයතනයකින් හෝ අධීක්ෂණ නිලධාරියකු විසින් සහතික කරන ලද බවට සාක්ෂි සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

V. ක්‍රියාත්මක තත්ත්වයේ පවතින ව්‍යාපෘතියක් අයදුම්කරු විසින් භාරගෙන තවදුරටත් ඉටු කරගෙන යාමක් මේ යටතේ ලකුණු ලබා ගැනීම සඳහා සුදුසුකම් නොලබයි.

VI. නිලධරයාගේ රාජකාරී කටයුතුවල කොටසක් වශයෙන් නිලධරයා ව්‍යාපෘතියේ අධ්‍යක්ෂ/ ක්‍රියාත්මක බලධරයා/ සම්බන්ධීකාරක වශයෙන් කටයුතු කරනු ලබන, ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමක් ලෙස හෝ වැඩසටහන් සංවර්ධනය කිරීමක් වශයෙන් අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ ආයතනය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතියක් ලකුණු ලබා දීම සඳහා සුදුසුකමක් නොවේ.

VII. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දෙනු ලැබූ පශ්චාත් උපාධි සුදුසුකමෙහි/ පශ්චාත් උපාධි පුහුණුවේ කොටසක් ලෙස ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.

VIII. අයදුම්කරු විසින් අයදුම් පත්‍රය සමඟ තමන් <u>ලකුණු ලබා ගැනීමට අපේක්ෂා කරන ව්‍යාපෘති</u> පිළිබඳ ලැයිස්තුවක් (<u>උපරිම ව්‍යාපෘති 08 ක්</u>) අමුණා ඉදිරිපත් කළ යුතුය. ___________

ඇමුණුම 2

<u>විශේෂ ව්‍යාපෘති සඳහා ලකුණු ලබා දීමේ පරිපාටිය</u>

I. අයදුම්කරුවන් තමා විසින් සම්පූර්ණ කරන ලද ව්‍යාපෘති අතුරින් තමා අයදුම්කරන තනතුරෙහි විෂය ක්ෂේත්‍රයට වඩාත් ගැලපෙන **<u>උපරිම ව්‍යාපෘති 08 ක්</u>** සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

II. ඇමුණුම 1 හි සඳහන් නිර්ණායකවලට අනුකූලව, එක් ව්‍යාපෘතියකට ලකුණු 02 බැගින් ව්‍යාපෘති 05 ක් සඳහා උපරිම ලකුණු 10 ක් (2*5 =10) ලබා දෙනු ලැබේ.

III. අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති මගින් අත්පත් කර ගන්නා ලද ප්‍රතිඵල පිළිබඳව ලකුණු ලබා දීමේ දී වඩාත් සැලකිලිමත් වනු ඇත.

ඇමුණුම 3

<u>පර්යේෂණ/ ප්‍රකාශන ඇගයීම සඳහා අදාළ කර ගත යුතු නිර්ණායක</u>

I. පර්යේෂණ/ප්‍රකාශන:

(අ) ජර්නල් පත්‍රිකා - සමාලෝචනයට ලක් කර අංකිත ප්‍රකාශන මාලාවක පළකරන ලද ශාස්ත්‍රීය වැදගත්කමක් සහිත සම්පූර්ණ පිටපතක් සහිත රචනයක් හෝ ලිපියක්

(ආ) සමුළු පත්‍රිකා/ උද්ධෘත/ අවසන් වශයෙන් පිටපත් කරන ලද රචනා

ශාස්ත්‍රීය වටිනාකමක් සහිත සම්මේලන, සභාවක්, සම්මන්ත්‍රණ, අධ්‍යන සම්මේලන, සංවාද මණ්ඩප, වැඩමුළු හෝ ශාස්ත්‍රීය සම්මන්ත්‍රණ සඳහා යොදා ගත් වාර්තා

**"සැ.යු. - ඉහත අවස්ථාවන් සඳහා එම පර්යේෂණ/ප්‍රකාශන ඉදිරිපත් කර ඇති බවට තහවුරු කිරීම අයදුම්කරුගේ වගකීම වේ."**

II. කර්තෘන් කිහිපදෙනෙකුගේ සහභාගීත්වයෙන් පළකරන ලද පර්යේෂණ/ප්‍රකාශන සම්බන්ධයෙන් අයදුම්කරුගේ දායකත්ව ප්‍රමාණය පැහැදිලිව දක්වා තිබිය යුතු අතර, එම දායකත්ව ප්‍රමාණයට සමානුපාතිකව අයදුම්කරුට ලකුණු ලබා දෙනු ලැබේ.

III. එකම දත්ත/ පර්යේෂණ තොරතුරු මත පදනම්ව පළකරනු ලබන, බොහෝදුරට සමාන නිගමනයන්ට එළැඹී ඇති පර්යේෂණ/ප්‍රකාශන වෙන් වෙන් පර්යේෂණ/ප්‍රකාශන වශයෙන් සලකා බලනු නොලැබේ. එවැනි අවස්ථාවකදී ලකුණු ලබා දීම සඳහා එක් පර්යේෂණයක්/ප්‍රකාශනයක් පමණක් සලකා බලනු ලැබේ.

IV. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දෙනු ලැබූ පශ්චාත් උපාධි සුදුසුකමෙහි/ පශ්චාත් උපාධි පුහුණුවේ කොටසක් ලෙස පළකරන ලද පර්යේෂණ/ප්‍රකාශන සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.

ඇමුණුම 4

<u>පර්යේෂණ/ප්‍රකාශන සඳහා ලකුණු ලබා දීමේ පරිපාටිය</u>

**01.** ලිපි සහ ජර්නල් පත්‍රිකා – ජාත්‍යන්තර/ජාතික මට්ටම/පිළිගත් උප ජාතික

1-3 – කතෘ ලැයිස්තුව – ලකුණු 02

>3 - ලකුණු 01

**02.** උද්ධෘත

1-3 – ලකුණු 01

>3 – ලකුණු 0.5

**03.** පෝස්ටර් ඉදිරිපත් කිරීම්

1-3 – ලකුණු 01

>3 – ලකුණු 0.5

**04.** වාචික ඉදිරිපත් කිරීම් - ලකුණු 0.5